DP/GIT/2019/01

මගේ අංකය : 6/32/GIT/2019
පාසල් විභාග සංවිධාන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.
2022 ඔක්තෝබර් මස 04 දින

සියලු ම පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා හා විදුහල්පතිවරුන් වෙත,

**සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය - 2019/2020/2021/2022(2023)**

උක්ත වර්ෂවලට අදාළ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාග සඳහා පෙනී සිටීමට නියමිත පාසල් අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කිරීමේ උපදෙස් මේ සමග එවමි. ඉල්ලුම්පත්‍ර 2022 ඔක්තෝබර් මස 20 දින සිට 2022 නොවැම්බර් මස 04 දින දක්වා යොමු කළ හැකි අතර එම දිනය නැවත දීර්ඝ කරනු නොලැබේ.

2. මෙම විභාගය පවත්වනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක ED/01/12/01/03/13 හා 2004.05.04 දින දරන චක්‍රලේඛයේ සහ අංක ED/03/38/1/27/01/(SUB) හා 2005.03.07 දින දරන විධිවිධාන අනුව ය.

**3. පද්ධතියට ප්‍රවේශ වීම**

(අ) අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ,

- නිල වෙබ් අඩවිය (https://doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති "මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග)" මත (Click) කර ඉන්පසු GIT - 2019, 2020, 2021, 2022(2023) Students Registration (School) මත (Click) කිරීම මගින් හෝ
- විභාග දෙපාර්තමේන්තුවේ නිල ජංගම දුරකථන යෙදවුම (mobile application) වන "DoE" වෙත පිවිස "මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග)" මත (Click) කර ඉන්පසු GIT - 2019, 2020, 2021, 2022(2023) Students Registration (School) මත (Click) කිරීම මගින් හෝ
- https://onlineexams.gov.lk/eic වෙත පිවිසීමෙන් පසු

(ආ) ලැබෙන ප්‍රවේශ කවුළුවේ, "School Account Login" වෙත පිවිස දැනටමත් ඔබට ලබාදී ඇති පරිශීලක නාම හා මුරපදය (school code හා password) ඇතුළත් කර පද්ධතියට ප්‍රවේශ වන්න. (ඔබ පාසල වෙත ලබාදී ඇති school code හා password අස්ථානගත වී ඇත්නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් එම තොරතුරු ලබා ගන්න.)

4. මෙම විභාග වර්ෂ හතර සඳහා මාර්ගගත (Online) ආකාරයෙන් පමණක් එකවර අයදුම්පත් යොමු කළ යුතු වේ. සිසුන්ගේ විභාග වර්ෂය තෝරා ගැනීමේ පහසුව සඳහා පහත සඳහන් කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කරන්න.

* 2019 වර්ෂයට අදාළ විභාග අපේක්ෂකයින් - 2020 ඔක්තෝබර් 12 සිට නොවැම්බර් 03 දින දක්වා අ.පො.ස.(උ.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිටි සිසුන්

* 2020 වර්ෂයට අදාළ විභාග අපේක්ෂකයින් - 2022 පෙබරවාරි 07 සිට මාර්තු 05 දින දක්වා අ.පො.ස.(උ.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිටි සිසුන්

* 2021 වර්ෂයට අදාළ විභාග අපේක්ෂකයින් - මෙම වර්ෂයට (2022) අ.පො.ස.(උ.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිටීමට නියමිත සිසුන්ය.

* 2022 වර්ෂයට අදාළ විභාග අපේක්ෂකයින් - 2023 වර්ෂයට අ.පො.ස (උ.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිටීමට නියමිත සිසුන්ය.

- මගේ සමාංක හා 2022.07.30 දිනැති ලිපිය සමඟ යොමු කළ අයදුම්පතට අනුව 2019 හා 2020 වර්ෂ සඳහා ඔබ විසින් දැනටමත් ලබා ගෙන ඇති ශිෂ්‍ය තොරතුරු ඒ ඒ වර්ෂ අනුව වෙන් වෙන්ව නිවැරදිව දත්ත පද්ධතියට ඇතුළත් කරන්න.

- 2019 හා 2020 වර්ෂ සඳහා සිසුන් ඇතුළත් කිරීමේදී ඔවුන් විභාගයට පෙනී සිටින බවට තහවුරු කර ගෙන ඔවුන්ගේ දත්ත පමණක් ඇතුළත් කළ යුතු ය. (විභාගයට ඉදිරිපත් නොවන සිසුන් දත්ත පද්ධතියට ඇතුළත් නොකළ යුතු ය.)

5. (අ) අයදුම්පත් සම්පූර්ණ කිරීමට පෙර ඔබ අනිවාර්යයෙන්ම කියවිය යුතු ලිපිය (ඇමුණුම 01)

(ආ) අයදුම්පත් සම්පූර්ණ කිරීමට පෙර පද්ධතිය තුළ ඇති තාක්ෂණික උපදෙස් හොඳින් කියවන්න. උපදෙස් වීඩියෝව නරඹන්න.

6. ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීම ඉතාමත්ම නිවැරදිව සිදු කළ යුතු ය. ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති නගර අංකය හෝ ඉල්ලුම් කළ මාධ්‍ය හෝ කිසිදු හේතුවක් නිසාවත් පසු ව වෙනස් කරනු නොලබන බැවින් මුල් අවස්ථාවේදී ම නිවැරදිව සම්පූර්ණ කිරීම විදුහල්පතිගේ හා ගුරුවරුන්ගේ වගකීමක් බව කරුණාවෙන් සලකන්න.

| |
|---|
| කිසිදු හේතුවක් නිසා විභාග මධ්‍යස්ථානය හෝ ඉල්ලුම් කරන ලද මාධ්‍යය හෝ පසුව වෙනස් කරනු නොලැබේ. එබැවින් ඉල්ලුම්පත්‍ර නිසි පරිදි සම්පූර්ණ කර එවීමට කටයුතු කරන්න. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට මෘදු පිටපතේ සඳහන් තොරතුරු නිවැරදි තොරතුරු බවට සලකා ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. |

7. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම පැවැත්වේ.

8. මාර්ගගත ක්‍රමයට සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපතක් ලබා ගෙන එහි ඇති සියලු තොරතුරු අයදුම්කරුවන් ලවා පරීක්ෂා කර තහවුරු කර ගත් පසු අයදුම්කරුවන්ගේ අත්සන් ලබා ගත යුතු ය. එම පිටපත විදුහල්පති අත්සන යොදා ආරක්ෂා සහිතව පාසලේ තබා ගත යුතු අතර මාර්ගගත ක්‍රමයට විභාග දෙපාර්තමේන්තුවට එවනු ලබන පිටපතේ ඇති සියලු තොරතුරු නිවැරදි බවට පරිවේණාධිපති/විදුහල්පති සහතික විය යුතු ය.

9. ඔබ විද්‍යාලයෙන් දෘශ්‍යාබාධිත/ශ්‍රවණාබාධිත/ වෙනත් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඔවුන් වෙනුවෙන් "Special Education Needs Students' Additional Data" සබැඳියේ ඇති තොරතුරු සම්පූර්ණ කළ යුතුය.
මෙවැනි අවශ්‍යතා සහිත සිසුන් සඳහා වඩාත් පහසුකම් සහිතව රත්මලාන හා තංගල්ල (පොලොම්මාරුව) විශේෂ විභාග මධ්‍යස්ථාන ස්ථාපිත කර ඇති බැවින් එම මධ්‍යස්ථාන වෙත සිසුන් යොමු කළ හැකිය.

10. අනන්‍යතාව ඔප්පු කිරීම :

මෙම විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු ම තම අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතු ය. ජාතික හැඳුනුම්පත වෙනුවට ඉදිරිපත් කළ හැක්කේ වලංගු විදේශ ගමන් බලපත්‍රය හා වලංගු රියදුරු බලපත්‍රය පමණි. වෙනත් කිසිදු හැඳුනුම්පතක් වලංගු හැඳුනුම්පතක් ලෙස පිළිගනු නොලැබේ. එබැවින් ජාතික හැඳුනුම්පත සිසුන්ට ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දීම විදුහල්පතිවරුන්ගේ වගකීමකි.

I. මෙම විභාගයේ අයදුම්පත් සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් එවා ඇති උපදෙස්වලට අමතරව යම් විමසීමක් කළ යුතු නම් පහත සඳහන් දුරකථන ඔස්සේ විමසන්න.

දුරකථන අංක : 011-2784208/ 011-2784537/ 011-2786616
විද්‍යුත් ලිපිනය : slexamseo@gmail.com
ෆැක්ස් අංක : 011-2784422

II. තාක්ෂණික ගැටලු විමසීම් (මාර්ගගත ඒකකය) 0113671568, 0113661122
විද්‍යුත් ලිපිනය : doeonlineexams@gmail.com

මේ සම්බන්ධයෙන් ඔබ ලබා දෙන දායකත්වය ඉතා අගය කරමි.

එල්.එම්.ඩී. ධර්මසේන
විභාග කොමසාරිස් ජනරාල්

පිටපත් : 01. සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - කරු.දැ.ගැ.ස.
02. සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - කරු. දැ.ගැ.ස.

U. U.A.6.20/GIT Prnci/EI U

ඇමුණුම 01

**අයදුම්පත් සම්පූර්ණ කිරීමට පෙර අනිවාර්යයෙන්ම කියවිය යුතුය.**

මගේ අංකය ‍ඃ 6/32/GIT/2020
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.
2022.10. 04

සියලුම විදුහල්පතිවරුන් වෙත,

## ප්‍රතිඵල ලේඛනවල නාම සංශෝධන

විභාග අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී අයදුම්කරුවන්ගේ උප්පැන්න සහතිකයේ සඳහන් නම ඉංග්‍රීසි අක්ෂරයෙන් පුරවා එවීමේ දී සිදුවන අතපසුවීම් නිසා එම ප්‍රතිඵල ලේඛනවල නාම සංශෝධන සඳහා දිනපතා විශාල පිරිසක් මෙම දෙපාර්තමේන්තුවට පැමිණෙති.

විදේශ රටවල අධ්‍යාපනික කටයුතුවලට සහ රැකියා සඳහා යාමේ ප්‍රවණතා වැඩිවී ඇති අතර, ඒ සඳහා ඔවුන්ට නිවැරදි නම් සහිත ප්‍රතිඵල ලේඛන පිටපත් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. නමේ එක් අකුරක හෝ වරදක් තිබේ නම් එම සහතිකය විදේශයන්හිදී ප්‍රතික්ෂේප වන බැවින් අයදුම්කරුවන් ඉමහත් අසීරුතාවයට පත්වේ.

පාසල් අයදුම්පත්වල දක්නට ලැබෙන සුලබ නාම සංශෝධන කිහිපයක් පහත දක්වේ.

- වාසගමේ කොටසක් අඩුවෙන් නම ලිවීම. උදා ඃ HERATHGE යන්න HERATH ලෙස ලිවීම.
- වාසගමේ කොටසක් වැඩියෙන් එකතුවීම. උදා ඃ ARACHCHIGE යන්න ARACHCHILAGE ලෙස ලිවීම.
- වාසගම තනිව තිබිය යුතු අවස්ථාවලදී වෙන් කර ලිවීම. උදා ඃ DENAGAMAGE යන්න DENA GAMAGE ලෙස ලිවීම.
- වෙන් කළ යුතු අවස්ථාවලදී තනිව ලිවීම. උදා ඃ KANDE RALALAGE යන්න KANDERALALAGE ලෙස ලිවීම.
- අනවශ්‍ය අකුරු එකතු කිරීම. උදා ඃ NISSANKA යන්න NISHSHANKA ලෙස ලිවීම.
- අත්‍යවශ්‍ය අකුරු අතහැර ලිවීම. උදා ඃ RANASINGHA යන්න RANASINHA ලෙස ලිවීම.
- සමාන උච්චාරණයේදී නියමිත අකුර නොයෙදීම.

  උදා ඃ 1. W/V TT/TH උදා ඃ VEENITHA යන්න පසුව W ලෙස වෙනස් කර යෙදීම.
  2. AMARASINGHA - GHE
  3. WARNAKULASURIYA - SOORIYA
- වචන මාරු කිරීම

  උදා ඃ AHAMAD MOHIDEEN - MOHIDEEN AHAMAD

තම නම ඉංග්‍රීසි භාෂාවෙන් නිවැරදිව ලියන ආකාරය ගැන අයදුම්කරුවන්ගේ අවධානය යොමු කිරීම ද වැදගත්වේ.

ඉහත කරුණු කෙරෙහි පෞද්ගලික අවධානය යොමු කොට පාසලේ සිටින ඉංග්‍රීසි භාෂාව උගන්වන ගුරුභවතාගේ ද උපකාර ලබා ගෙන නිවැරදිව අයදුම්පත් සම්පූර්ණ කර එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

එල්.එම්.ඩී. ධර්මසේන
විභාග කොමසාරිස් ජනරාල්

H:\C A\6.20\school name.docx